සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2019

# බුද්ධ ධර්මය

9 ශ්‍රේණිය | කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි

- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙක බැගින් හිමි වේ.
- දෙවන කොටසේ පළමු පළමු ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

## I - කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 බුදුරජාණන් වහන්සේ අවසන් වස් කාලය ගත කළේ,

(1) කුසිනාරා නුවර ය. (2) පාවා නුවර ය.

(3) භෝග නගරයේ ය. (4) බේලුව ගමේ ය.

02 ඤාය යනු

(1) තෙරුවනට නමකි. (2) පැවිදිවීමට නමකි.

(3) නිවන් මඟට නමකි. (4) ත්‍රිශික්ෂාවට නමකි.

03 පැවිදිවීමට පෙර මහා ප්‍රජාපතී ගෝතමී දේවිය පත්ව තිබුනේ,

(1) සෝවාන් ඵලයට ය. (2) අරහත් ඵලයට ය.

(3) සකෘදාගාමී ඵලයට ය. (4) අනාගාමී ඵලයට ය.

04 පුද්ගලයකු විසින් රැස් කර ගත යුතු අධ්‍යාත්මික ධන

(1) තුනකි. (2) හතරකි. (3) හතකි. (4) දෙකකි.

05 අන් අයගේ ඇනුම් බැනුම් ගැරහීම්වලට ලක්වීම

(1) දුකයි (2) නින්දාවයි (3) අලාභයයි (4) අකුසලයයි

- **අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න.**

(නිපකො / මුදිතා / සුභර / ශ්‍රී බුද්ධ රශ්මි / බහුශ්‍රැත / ආනාපාන සති / සාහිත්‍ය චක්‍රවර්ති / කරුණාව / ස්ථානෝචිත ප්‍රඥාව / මෛත්‍රී)

06 රූප මදයෙන් මත් ව ක්‍රියා කළ ඛේමාවන්ට රූපයේ අනිත්‍යතාව පසක් කර දීමෙන් පැහැදිලි වන්නේ බුදුරජාණන් වහන්සේ තුළ පැවති .......................................................... යි.

07 කුඩා සිදුහත් කුමරු දඹ රුක් සෙවණෙහි පලඟ බැඳගෙන වැඩූ භාවනාව වන්නේ .................................... යි.

08 අන් අයගේ දියුණුව දැක එම දියුණුව තමාට ඇතිවූවක් සේ සලකා සතුටට පත් වන ස්වභාවය ............................................................................ යි.

09 ආනන්ද මෛත්‍රිය නා හිමියන් ආරම්භ කළ පුවත්පතකි ........................................................................

10 පෝෂණය කිරීම පහසු ය යන්න දහමේ ..................................................................................... නම් වේ.

- **අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ තිබෙන වරහන තුළ යොදන්න.**

11 බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව ථූපාරාමයේ නිදන් කර ඇත. ( )

12 ධම්මපදය ඛුද්දක නිකායට අයත් ග්‍රන්ථ 15 න් එකකි. ( )

13 රිය සකෙහි චක්‍රය, නාභිය සහ අර අතර සම්බන්ධය ගිහි - පැවිදි සබඳතාවය මෙන් ය. ( )

14 පූර්ණ කස්සප ශාස්තෘවරයා කර්මය ප්‍රතික්ෂේප කරයි. ( )

15 පංච නීවරණ ආදී ධර්ම අනුව සිහිය යෙදවීම චිත්තානුපස්සනාව නම් වේ. ( )

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

| | A | | B |
|---|---|---|---|
| 16 | පංච නීවරණ ධර්මයකි | * | වස විෂ වෙළදාම |
| 17 | ජෛන මහා වීර තුමා | * | සල්ලහුකවුත්ති |
| 18 | අධාර්මික වෙළඳාමකි | * | නොඇලීම |
| 19 | සැහැල්ලු පැවැත්ම | * | ව්‍යාපාද |
| 20 | විරාගය | * | කර්මවාදියෙකි |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, 02 සිට 07 දක්වා ප්‍රශ්නවලට ලකුණු 10 බැගින් ද හිමිවේ.**

01 කෙටි පිළිතුරු ලියන්න.

(i) භද්දකච්චායනා තෙරණිය ලද අග තනතුර කුමක් ද?

(ii) මෛත්‍රිය වැඩීමේ දී මවක තම එකම පුතුට දක්වන හිතවත්කමට සමාන හිතවත්කමක් සියලු ජීවීන් කෙරෙහි දැක්විය යුතු බව සඳහන් වන සූත්‍රය කුමක් ද?

(iii) සීලයේ මූලික ප්‍රභේද 2 ක් දක්වන්න.

(iv) සිඟාලෝවාද සූත්‍රයට අනුව පැවිදි උතුමන් විසින් ගිහියන්ට ප්‍රති උපකාර දැක්විය යුතු ආකාර 2 ක් ලියන්න.

(v) බලංගොඩ ආනන්ද මෛත්‍රිය හිමි රචිත ග්‍රන්ථ 2 ක් ලියන්න.

(vi) බුදු දහමට අනුව සැපය දෙයාකාර ය. ඒ මොනවා ද?

(vii) අනුරාධපුරයේ ඉදිවූ වැව් හා දාගැබ් 2 බැගින් ලියන්න.

(viii) නිවන හැඳින්වීමට වෙනත් නම් 2 ක් ලියන්න.

(ix) සම්මා වායාමය සතරාකාරය. ඉන් 2 ක් නම් කරන්න.

(x) බුදුරජාණන් වහන්සේට විපාක දුන් අකුසල කර්ම 2 ක් නම් කරන්න. (ලකුණු $2 \times 10 = 20$)

02 (i) බුද්ධ චරිතයේ අකම්පිත බව හා ඍජු බව ප්‍රකට වන අවස්ථාව බැගින් ලියන්න. (ලකුණු 02)

(ii) බුදුරජාණන් වහන්සේ විසින් දෙවියන්ට දේශිත සූත්‍ර 3 ක් ලියන්න. (ලකුණු 03)

(iii) බුදු සිරිතේ නායකත්ව ලක්‍ෂණ ඇසුරින් ආදර්ශ පාඨ 5 ක් ලියන්න. (ලකුණු 05)

03 (i) අටලෝ දහමට අනුව ලාභ, අලාභ ධර්මතා සඳහා නිදසුන බැගින් බුද්ධ චරිතය ඇසුරින් ලබාදෙන්න. (ලකුණු 02)

(ii) ''ඵුට්ඨස්ස ලෝක ධම්මේහි'' ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 03)

(iii) අටලෝ දහමෙන් එකක් තෝරාගෙන ඔබේ ජීවිතය ඇසුරින් ඔබ මුහුණ දුන් අත්දැකීමක් විස්තර කරන්න. (ලකුණු 05)

04 (i) අතීතයේ සමස්ත තුන් සිංහලයට අයත් වූ ප්‍රදේශ තුනෙන් 2 ක් ලියන්න. (ලකුණු 02)

(ii) වැව අර්ථවත් කළ මෙලොව සැපත පැහැදිලි කරන්න. (ලකුණු 03)

(iii) වැව හා දාගැබ ඇසුරින් මිනිසා අතර වර්ධනය වූ ගුණාංග 05 ක් දක්වන්න. (ලකුණු 05)

05 (i) බුද්ධාදී ආර්ය උතුමන්ගේ අත්දැකීම ලෙස හඳුන්වන්නේ කුමක් ද? (ලකුණු 02)

(ii) නිවන පරම සැපයක් ලෙස හැඳින්වීමට හේතුව කුමක් ද? (ලකුණු 03)

(iii) අල්පේච්ඡ ජීවිතයක් ගත කරන්නාගේ ලක්ෂණ 5 ක් ලියන්න. (ලකුණු 05)

06 (i) චතුරාර්ය සත්‍ය අතරින් 2 ක් ලියන්න. (ලකුණු 02)

(ii) ධාර්මික රැකියා 3 ක් ලියන්න. (ලකුණු 03)

(iii) ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනයෙන් ශිෂ්‍ය ඔබට ලැබෙන යහපත් ප්‍රතිඵල මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)

07 පහත සඳහන් මාතෘකා අතරින් 2 ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) බුදු දහමේ ඉගැන්වෙන කර්ම සංකල්පය

(ii) භාවනාව

(iii) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණිය

(iv) ත්‍රිකෝටි පාරිශුද්ධ ශීලය (ලකුණු 5 x 2 = 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) 4 (02) 3 (03) 1 (04) 3 (05) 2 (06) ස්ථානෝචිත ප්‍රඥාව
(07) ආනාපානසති (08) මුදිතා (09) ශ්‍රී බුද්ධ රශ්මි (10) සුහර (11) ✓
(12) ✓ (13) × (14) ✓ (15) × (16) ව්‍යාපාද (17) කර්මවාදියෙකි
(18) වස විෂ වෙළඳාම (19) සල්ලහුකවුත්ති (20) නොඇලීම (ල. 20 x 20 = 40)

## II - කොටස

01 (i) අභිඥාලාභීන් අතර අග්‍රස්ථානය
(ii) කරණීයමෙත්ත සූත්‍රය
(iii) චාරිත්‍ර හා වාරිත්‍ර (විරතිය හෝ සමාදානය)
(iv) වැරදි ක්‍රියාවලින් වළක්වා ගැනීම. යහපත් ක්‍රියාවල යෙදවීම
(v) බුද්ධ චරිතය, ශ්‍රී ශාක්‍යමුනින්ද්‍රාවදානය හෙවත් සිද්ධාර්ථ ගෞතම බුද්ධ චරිතය
(vi) කායික සැප හා මානසික සැප
(vii) වැව් - තිසාවැව, නුවර වැව... / දාගැබ් - ථූපාරාමය, රුවන්වැලි සෑය...
(viii) නිරෝධය, විරාගය, අසංඛත
(ix) නුපන් අකුසල් නූපදවීමට දරන වෑයම, උපන් කුසල් දුරුකිරීමට දරන වෑයම
(x) හිසරදය, කොන්දේ ආබාධය ... (ලකුණු 2 x 10 = 20 යි.)

02 (i) අකම්පිත - ආරාම ප්‍රතිලාභයෙන් උද්දාම නොවීම....
සෘජු - ඡන්න හිමිට බ්‍රහ්ම දණ්ඩණය පැනවීමට දැන්වීම.... (ලකුණු 02)
(ii) මංගල, පරාභව, මහාසමය (ලකුණු 03)
(iii) පිළිතුර සලකා ලකුණු දෙන්න. (ලකුණු 05)

03 (i) ලාභ - ආරාම ප්‍රතිලාභ, ප්‍රශංසා ආදිය
අලාභ - දාන නොලැබීම්, නින්දා (ලකුණු 02)
(ii) චිත්තං යස්සන කම්පති - අසෝකං විරජං ඛේමං - ඒතං මංගල මුත්තමං (ලකුණු 03)
(iii) පිළිතුර සලකා ලකුණු දෙන්න. (ලකුණු 05)

04 (i) රුහුණු, මායා, පිහිටි (ලකුණු 02)
(ii) ආර්ථික අභිවෘද්ධිය (ලකුණු 03)
(iii) පිළිතුර සලකා ලකුණු දෙන්න. (ලකුණු 05)

05 (i) නිවන (ලකුණු 02)
(ii) පිළිතුර සලකා ලකුණු දෙන්න. (ලකුණු 03)
(iii) පිළිතුර සලකා ලකුණු දෙන්න. (ලකුණු 05)

06 (i) දුක්ඛ ආර්ය සත්‍යය, දුක්ඛ සමුදය ආර්ය සත්‍යය.... (ලකුණු 02)
(ii) ගොවිතැන, සත්ත්ව පාලනය, වෙළඳාම ..... (ලකුණු 03)
(iii) පිළිතුර සලකා ලකුණු දෙන්න. (ලකුණු 05)

07 පිළිතුරු සලකා ලකුණු දෙන්න. (ලකුණු 5 x 2 = 10)